# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2069/3 – 2018 මැයි 01 වැනි අඟහරුවාදා – 2018.05.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිපැන්න ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේජ්/එම්ටීජී/17/214 හා 2017.07.27 දිනැති ප්‍රමාණයෙන් හෙක්. 0.0519ක් පමණ වන පහත නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පිඹුරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0519**
උතුරට: වීරසිංහගේ පුන්‍යා කාන්ති සහ දොන් හේෂාන් අසංග ජයනෙත්ති හිමිකම් කියන දික්පිටවත්ත; නැගෙනහිරට: දොන් හේෂාන් අසංග ජයනෙත්ති සහ අරුමප්පෙරුම ආරච්චිගේ තේජා ඉන්ද්‍රානි හිමිකම් කියන දික්පිටවත්ත; දකුණට: අරුමප්පෙරුම ආරච්චිගේ තේජා ඉන්ද්‍රානි හිමිකම් කියන දික්පිටවත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ වීරසිංහගේ පුන්‍යා කාන්ති හිමිකම් කියන දික්පිටවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2017/එල්ඕ/100.
2018 අප්‍රේල් මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 415